# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 54 දරන
# බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 අගෝස්තු මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 සැප්තැම්බර් 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

## 1979 අංක 54 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 අගෝස්තු මස 30 වන දින.]

එල්. ඩී.—ඕ. 79/75.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 54 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනතෙහි 4 වන වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන පනතෙහි 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "(අඅ) සිරකරුවන්ගේ වේතන සහ පුද්ගලික මුදල් ගිණුම වූ පොදු තැන්පතුවෙහි යම් සිරකරුවකුගේ බැරට ඇත්තා වූ මුදල්වලින්, ඒ සිරකරු මුදා හරිනු ලැබූ දිනයේ සිට වර්ෂයකට නොඅඩු කාලයක් තුළ හිමිකම් පානු නොලැබ තිබෙන්නා වූ යම් මුදලක් ;".

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) එම වගන්තිය අවසානයේ ඇති නැවතීමේ ලකුණ වෙනුවට තිත් කොමාවක් ආදේශ කිරීමෙන් ; සහ

(ii) එම වගන්තිය අගට පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

> '(ඊ) සිරකරුවන් බන්ධනාගාරයෙන් නිදහස් කරනු ලැබීමෙන් පසුව ඔවුන්ගේ පුනරුත්ථාපනයෙහි ලා උපකාරී වන පශ්චාත් භාර සේවා.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.